ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ හා එහි පරිපාලිතය - 2024

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ ("කාර්යාංශය") සහ කාර්යාංශයේ හා එහි පරිපාලිතයේ ("සමූහය") 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කාර්යාංශයේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කාර්යාංශයේ හා සමූහයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කාර්යාංශය හා සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කාර්යාංශයේ හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

කාර්යාංශයේ හා සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කාර්යාංශයේ හා සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කාර්යාංශයේ හා සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල කාර්යාංශයේ හා සමූහයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේ ද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කාර්යාංශයේ හා සමූහයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කාර්යාංශය හා සමූහය ක්‍රියා කර ඇති බව,

- කාර්යාංශය හා සමූහය සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- කාර්යාංශයේ හා සමූහයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 51 ඡේදය ප්‍රකාරව දේපල, පිරියත සහ උපකරණවල 2024 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද පිරිවැය රු.මිලියන 419.92ක් වූ දේපල පිරියත හා උපකරණවල ප්‍රයෝජනවත් ආර්ථික ආයු කාලය නැවත තක්සේරු කිරීමකින් තොරව කාර්යාංශය විසින් එම වත්කම් අඛණ්ඩව භාවිතා කරමින් පැවතුණි.	දැනටමත් ඉංජිනේරු ප්‍රසම්පාදන ඉදිකිරීම් (EPC) අංශයේ වත්කම් නැවත ඇස්තමේන්තුකර ගිණුම්ගත කර ඇති අතර උපදේශන අංශයේ සහ මූලික කාර්යාල වැඩබිම්වල ප්‍රයෝජනවත් ජීවිත කාලය නැවත තක්සේරු කර ඇස්තමේන්තු කර අවසන් බැවින් 2025 වසර තුළ එම අගයන් ගිණුම්වල ගැලපීමට කටයුතු කරනු ඇත.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව වත්කම්වල ප්‍රයෝජනවත් ආර්ථික ආයුකාලය තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපුම් කළ යුතුය.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ව්‍යාපෘති 10 ක් වෙනුවෙන් රාජ්‍ය ආයතන 8 කින් කාර්යංශයට ලැබිය යුතු එකතුව රු. මිලියන 14.85 ක පැරණි ශේෂයක් වැරදි නිවැරදි කිරීම් ලෙස සමාලෝචිත වර්ෂයේ ලාභයෙන් කපා හැරීමට කටයුතු කර තිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අවප්‍රමාණය වී තිබුණි.	විගණන හා කළමනාකරණ කමිටු තීරණ අනුව මෙලෙස ගිණුම්කරණ දෝෂ නිවැරදි කර ඇත.	හානිකරණ අලාභ වෙන්කිරීම තුළ ඇතුළත් ණයගැති ශේෂයන්හි වැරදි නිවැරදි කිරීම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම, අධ්‍යක්ෂ මණ්ඩල

අනුමැතිය ලබාගැනීම හා සමුච්චිත ලාභයට ගැලපීම සිදු කළ යුතුය.

1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

	විෂයය	මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.මිලියන	අනුරූපී වාර්තා අනුව වටිනාකම රු.මිලියන	වෙනස රු.මිලියන	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා සබරගමුව විශ්ව විද්‍යාලය, තහනම් උත්තේජක නිවාරන නියෝජ්‍යායතනය සහ ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය යන ආයතනයන්හි ඉදිකිරීම් ව්‍යාපෘති 12කට අදාළ ණය සහ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව හා ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය යන ආයතනයන්හි උපදේශන සේවා ව්‍යාපෘති 40කට අදාළ ණයගැති ශේෂය.	205.16	42.14	163.02	එක් එක් ණයගැති ශේෂයන් සම්බන්ධයෙන් වෙන වෙනම අදහස් දක්වා තිබුණු අතර ඉන් අවස්ථා 30කදී ශේෂයන් සම්බන්ධයෙන් සේවාදායක ආයතන වෙත සිහිකැඳවීම් සිදුකර ඇතත් ප්‍රතිචාර දක්වා නොමැත.	ලැබිය යුතු ශේෂයන්හි නිරවද්‍යතාවය හා පැවැත්ම තහවුරු කිරීම සඳහා පිළිගත හැකි සාක්ෂි සහ විස්තර ඉදිරිපත් කිරීමට පියවරගත යුතු අතර ප්‍රමාදයකින් තොරව හිඟ ශේෂයන් අයකර ගැනීමට ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතුය.

(ආ)	(i) වෙළඳ ලැබිය යුතු ශේෂ	53.20	62.16	8.96	වෙළඳ ණයහිමි ශේෂයන් පරිපාලිත සමාගම විසින් නියමිත ගැලපීම් සිදුකර නොගැනීම හේතුවෙන් රු. මිලියන 8.9 ක වෙළඳ ණයගැති ශේෂයේ වෙනසක් සිදුව ඇත.	සම්බන්ධිත පාර්ශව අතර ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ සන්සන්දනය කිරීමට කටයුතු කළ යුතුය.
	(ii) ලැබිය යුතු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම්	2,239.57	2,242.95	3.38	පරිපාලිත සමාගම විසින් ගෙවිය යුතු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ශේෂයන්හී නියමිත ගැලපීම් සිදුකර නොගැනීම හේතුවෙන් රු.මිලියන 3.3 ක ලැබිය යුතු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම්හි වෙනසක් සිදුව ඇත.	සම්බන්ධිත පාර්ශව අතර ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ සන්සන්දනය කිරීමට කටයුතු කළ යුතුය.

1.5.4 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පරිපාලිත සමාගමේ {මධ්‍යම ඉංජිනේරු සේවා (පුද්ගලික) සමාගම} මූල්‍ය ප්‍රකාශන පිළිබඳ තත්ත්වාගණනය කළ මතය පහත නිරීක්ෂණ මත පදනම්ව මා විසින් ප්‍රකාශ කර ඇත.

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 51 ඡේදය ප්‍රකාරව දේපල, පිරියත සහ උපකරණවල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය වාර්ෂිකව සමාලෝචනය කළ යුතු අතර සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 2.3.6 අනුව ද සමාගම විසින් වාර්ෂිකව දේපල පිරියත සහ උපකරණවල ප්‍රයෝජනවත් ආයුකාලය සමාලෝචනය කරන බව සඳහන් වුවද, 2024 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද පිරිවැය රු.මිලියන 883.88ක් වූ දේපල පිරියත හා උපකරණවල ප්‍රයෝජනවත් ආර්ථික ආයු කාලය නැවත තක්සේරු කිරීමකින් තොරව සහ ශ්‍රී ලංකා	ඇස්තමේන්තු ජීව කාලය වෙනස් වීම මත වත්කම් නැවත අගය කිරීම සිදු කිරීමට සැලසුම් කර ඇති අතර සුදුසු පරිදි වත්කම් බාණ්ඩ වශයෙන් තක්සේරු කිරීමට සැලසුම් කර ඇත.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව වත්කම්වල ප්‍රයෝජනවත් ආර්ථික ආයු කාලය වාර්ෂිකව සමාලෝචනය කළ යුතුය.

	ගිණුම්කරන ප්‍රමිත අංක 08ට අනුකූලව ඇස්තමේන්තු වෙනස්කම් නිවැරදි කරමින් හා නිවැරදි ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමකින් තොරව සමාගම විසින් එම වත්කම් අඛණ්ඩව භාවිතා කරමින් පැවතුණි.		
(ආ)	සමාගමේ වෙළඳ ගෙවිය යුතු දෑ, ගෙවිය යුතු රඳවාගැනීම් සහ වෙළඳ ලැබිය යුතු දෑ පිළිබඳ විස්තරාත්මක උපලේඛන අනුව පිළිවෙලින් රු.මිලියන 64.85ක්, රු.මිලියන 28.42ක් සහ රු.මිලියන 26.54ක් සමාගම නමින්ම ඇතුළත් කර තිබුණි. ඒ අනුව ආයතනයේ අභ්‍යන්තර ඒකක අතර සිදුවන ගනුදෙනු අවසාන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී සැසඳීම්කර හා නිවැරදිකර මූල්‍ය ප්‍රකාශන සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සඳහා කළමනාකාරීත්වය විසින් අවධානය යොමුකර නොතිබුණි.	එම අයිතම පිළිබඳව වැඩිදුර සොයා බලා ලබන වසරේදී නිසි පරිදි ගිණුම්ගත කරනු ඇත.	කාර්යාංශයේ මූලික කාර්යාල හා අංශ අතර සිදුවන ගණුදෙනු සහ ශේෂයන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සැසඳුම්කර ගැලපීමට කටයුතු කළ යුතුය.
(ඇ)	මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී සමාගමේ මූලික කාර්යාල අතර සිදුවූ අභ්‍යන්තර ගනුදෙනු ඉවත් කිරීම සිදුකල යුතු වුවත් රු.මිලියන 27.71ක අභ්‍යන්තර ගණුදෙනු වෙනත් ආදායම් යටතේ ගිණුම්ගත කිරීමෙන් ආදායම එම ප්‍රමාණයෙන් අධි ගණනය වී තිබුණි.	ලබන වසරේදී නිසි පරිදි ගිණුම්ගත කරනු ඇත.	කාර්යාංශයේ මූලික කාර්යාල හා අංශ අතර සිදුවන ගණුදෙනු සහ ශේෂයන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී සැසඳුම්කර ගැලපීමට කටයුතු කළ යුතුය.
(ඈ)	2024 ජනවාරි මාසයේ පැවති වාර්ෂික තොග සහ වත්කම් සත්‍යාපනයේදී දකුණු පළාතේ ගාල්ල හා මාතර යන ව්‍යාපෘති ඒකක 03ට අයත් තොග සහ වත්කම් අයිතම රාශියක අතිරික්තයක් ඇති බවත් වෙන්දේසි කිරීම් හා වෙනත් කාර්යයන් මගින් ඉවත් කළ ස්ථාවර වත්කම් ව්‍යවසාය සම්පත් සැලසුම් (ERP) පද්ධතිය තුළ තවදුරටත් පවතින බවත්, වත්කම් අයිතම කිහිපයක ඌණතා පවතින බවත් අනාවරණය වී තිබුණි. කෙසේ වෙතත් එම අතිරික්තතා හා ඌණතාවල මූල්‍යමය වටිනාකම වාර්තා කරන දිනය වන විටත් එම පද්ධතිය තුළ ගැලපුම් කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.	අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව අදාළ අයිතම ගිණුම්ගත කිරීම ඉදිරියේදී සිදුකරනු ඇත.	අතිරික්තතා සහ ඌණතාවල වටිනාකම් හඳුනාගෙන ERP පද්ධතිය තුළ ගැලපුම් කිරීමට කටයුතු කළ යුතුය.

(ඉ)	සමාලෝචිත වර්ෂයේ වෙනත් ආදායම් යටතේ දක්වා තිබුණු රු.මිලියන 2.74ක වත්කම් අපහරණ ලාභය තුළ පෙර වර්ෂවල අපහරණයන්ට අදාළ අධි ක්ෂය ගැලපීම් (Adjustment of Over - depreciated amount in disposal from previous years) රු.මිලියන 1.69ක් ඇතුළත් කර තිබීමෙන් වර්ෂයේ වෙනත් ආදායම් එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි.	මෙම ගැලපුම මුළු ක්ෂය වියදමට සාපේක්ෂව ඉතා කුඩා මුදලක්වන බැවින් අදාළ වර්ෂයට ගැලපීම සිදුකර ඇත.	සමාලෝචිත වර්ෂයට අදාළ නොවන වත්කම් අපහරණ ලාභය පෙර වර්ෂයට අදාළ ගැලපුම් යටතේ ගිණුම්ගත කළ යුතුය.

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය අවසානයේ කාර්යාංශය වෙත අයවිය යුතු මුළු ණයගැති ශේෂය රු.මිලියන 5,188.58ක් වූ අතර එහි ඇතුළත් ඉංජිනේරු ප්‍රසම්පාදන ඉදිකිරීම් (EPC) අංශයේ වර්ෂ 3–5 අතර ණයගැති ශේෂයන් සහ වර්ෂ 5 ඉක්මවූ ණයගැති ශේෂයන් පිළිවෙලින් රු.මිලියන 200.29 ක් සහ රු.මිලියන 1,342.39ක් ද උපදේශන අංශයේ වර්ෂ 3–5 අතර සහ වර්ෂ 5 ඉක්මවූ ණයගැති ශේෂයන් පිළිවෙලින් රු. මිලියන 658.45ක් සහ රු.මිලියන 130.94 ක් ද විය. කාර්යාංශයට ලැබිය යුතු ණයගැති මුදල් කාලීනව එකතු කර ගැනීමට විධිමත්ව කටයුතු කර නොතිබුණු අතර, ණයගැති ශේෂ සනාතන ලියවිලි විගණනය වෙත ඉදිරිපත් නොකළ බැවින් ණයගැති ශේෂයන්හි පැවැත්ම සහ වටිනාකම සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට ද නොහැකි විය.	වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම්වලින් හිලව් කිරීමට ඉල්ලීම් කර ඇති තාවකාලිකව අත්හිටුවා ඇති ව්‍යාපෘති සහ කාර්යාංශය මඟින් ඉදිරිපත් කර ඇති ඉන්වොයිසි සඳහා ප්‍රතිචාර නොදක්වන දිගු කාලීන ණයගැති ශේෂ පිළිවෙලින් EPC අංශයේ රු.මිලියන 987.56ක් හා උපදේශන අංශයේ රු.මිලියන 497.69ක් හඳුනාගෙන ඇති අතර මේ පිළිබඳ දිගින් දිගටම කාර්යාංශයේ අධ්‍යක්ෂක මණ්ඩලය, අමාත්‍යාංශය විගණන කමිටුව, කාර්යාංශ විගණන කමිටුව දිගින් දිගටම දැනුවත් කළද තවමත් යහපත් ප්‍රතිචාරයක් ලැබී නැත. මේ හේතුවෙන් අප විසින් ණයගැති ශේෂය නිවැරදිව ගිණුම්වල ඉදිරිපත් විය යුතු බැවින් 2024 දෙසැම්බර් 31 දිනවන විට රු.මිලියන 1,790.79 ක් බොල්ණය ලෙස ගිණුම්ගත කර ඇත.	නිවැරදිව ණයගැති වටිනාකම් හඳුනා ගනිමින් සහ ශේෂ සනාථ කර ගැනීම් අඛණ්ඩව වාර්ෂිකව සිදුකර ණයගැති ශේෂ කාලීනව අයකර ගැනීමට සියලු ක්‍රියාමාර්ග ගත යුතුය.

(ආ)	කාර්යාංශය විසින් කාලානුරූපව ව්‍යාපෘති පසුවිපරම් කර රඳවාගැනීම් මුදල් නිදහස් කර ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.මිලියන 2,712.45ක ලැබිය යුතු රඳවා ගැනීම් ශේෂය තුළ වසර 3 සිට 5 දක්වා රු.මිලියන 691.21ක් ද, වසර 05ට වැඩි රු.මිලියන 944ක්ද පැවතුණි.	ගිවිසුම් එකඟතා අවසන් කිරීම, කටයුතු අත්හිටුවීම සහ මුදල් ගැටළු වැනි කරුණු නිසා ඉදිකිරීම් ව්‍යාපෘති ප්‍රමාදවෙමින් පවතින අතර ඒ මත බොහෝ ව්‍යාපෘති අවුරුදු පහකට වඩා දිගටම ක්‍රියාත්මක වන අතර, එමඟින් රඳවා ඇති මුදල් ලැබිය යුතු තැන්පතු ගිණුම්වල පවතියි. තවත් කරුණක් වශයෙන්, අවසන් බිල්පත සඳහා ස්ථාවර තාක්ෂණික ඇගයීම් කමිටුවේ (STC) අනුමැතිය ලබා ගැනීම සඳහා ද කාලය ගතවනු ඇත.	කාර්යාංශය විසින් කාලානුරූපීව ව්‍යාපෘති පසුවිපරම්කර අදාළ යථාවත් කිරීම් සිදුකිරීමෙන් පසු රඳවාගැනීම් මුදල් නිදහස්කර ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගත යුතුය.

1.6.2 ගෙවිය යුතු මුදල්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය අවසානයේ මුළු ණයහිමි ශේෂය රු.මිලියන 2,103.68ක් වූ අතර එහි ඇතුළත් ඉංජිනේරු ප්‍රසම්පාදන ඉදිකිරීම් (EPC) අංශයේ වර්ෂ 3–5 අතර ණයහිමි ශේෂයන් සහ වර්ෂ 5 ඉක්ම වූ ණයහිමි ශේෂයන් පිළිවෙලින් රු.මිලියන 162.76ක් සහ රු.මිලියන 696.83ක් ද උපදේශන අංශයේ වර්ෂ 3–5 අතර ණයහිමි ශේෂයන් සහ වර්ෂ 5 ඉක්ම වූ ණයහිමි ශේෂයන් පිළිවෙලින් රු.මිලියන 3.89ක් සහ රු.මිලියන 40.08ක් ද විය. ඒ අනුව කාර්යාංශය විසින් ණයහිමි ශේෂ කාලීනව පියවීමට කටයුතු කර නොතිබුණි.	අපගේ හිමිකම් ඇති ගිණුම් ශේෂය ඉන්වොයිසි මඟින් තහවුරු කළ හැක. මුළු හිමිකම් ශේෂයෙන් රු. මිලියන 1,592.09 ක් පරිපාලිත සමාගම වෙත ගෙවිය යුතු මුදල්වන අතර, මෙම මුදල අපගේ ගනුදෙනුකරුවාගෙන් ලැබිය යුතු ණය ශේෂය සමඟ හිලව් කිරීමෙන් පසුව, ශුද්ධ හිමිකම් ශේෂය රු. මිලියන 500කට අඩු වනු ඇත.	නිවැරදිව ණයහිමි වටිනාකම් හඳුනාගනිමින් සහ ශේෂ සනාථ කර ගැනීම් අඛණ්ඩව වාර්ෂිකව සිදුකර ණයහිමි ශේෂය කාලීනව නිරවුල්කර ගැනීමට සියලු ක්‍රියාමාර්ග ගත යුතුය.

(ආ)	සමාලෝචිත වර්ෂය අවසානයට ජංගම වගකීම් යටතේ පෙන්වනු ලබන ගෙවිය යුතු රඳවා ගැනීම් ශේෂය රු.මිලියන 2,392.75ක් වූ අතර විගණනයට ඉදිරිපත් කරන ලද කාල විශ්ලේෂණයට අනුව මෙම ගෙවිය යුතු රඳවා ගැනීම් ශේෂය තුළ වසර 3 සිට 5 දක්වා වූ රු.මිලියන 756.86 ක්ද, වසර 05ට වැඩි රු.මිලියන 574.52 ක්ද නිරවුල් කර නොතිබුණි.	වර්තමාන ගෙවිය යුතු රඳවාගැනීම් රු. මිලියන 2,712.45ක් වන අතර, එයින් රු. මිලියන 2,107.28ක් පරිපාලිත සමාගම වෙත ගෙවිය යුතුය. එම නිසා, රඳවා ඇති මුදලේ සියයට 90කට වඩා වැඩි ප්‍රතිශතයක් පරිපාලිත සමාගම වෙත වූ වගකීමක් ලෙස දැක්වේ. මෙම මුදලට සමාන වටිනාකමකින් අප විසින් ගනුදෙනුකරුවාගෙන් ලැබිය යුතු රඳවා ඇති මුදලක් ලෙස ලේඛනගත කර ඇත.	නිවැරදිව ගෙවිය යුතු රඳවා ගැනීම් ශේෂයන් හඳුනා ගනිමින් කාර්යාංශයේ මූල්‍ය ක්‍රියාපටිපාටි අත් පොතට අනුව එම ශේෂය කාලීනව නිරවුල් කිරීමට සියලු ක්‍රියාමාර්ග ගත යුතුය.

1.7 සම්බන්ධිත පාර්ශවයන් හා සම්බන්ධිත පාර්ශව ගනුදෙනු හෙළිදරව් නොකිරීම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂය අවසාන වන විට පරිපාලිත සමාගමෙන් රු.මිලියන 1,569.4ක් කාර්යාංශයට ලැබිය යුතුව පවතින අතර මේ සම්බන්ධයෙන් දෙපාර්ශවය අතර නිසි සහ යාවත්කාලීන ගිවිසුම් පවත්වා ගෙන ගොස් නොතිබුණි. තවද, මෙම ශේෂය නිරවුල් කිරීමට හෝ ආයතනයන්හි ඉදිරි ගනුදෙනු මෙහෙයවීම සම්බන්ධයෙන් කිසිඳු ඵලදායි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු අතර 2017 වසරේ සිට අඛණ්ඩව මෙම ශේෂය ඉහළ ගොස් තිබුණි.	පරිපාලිත සමාගම ආරම්භ කරනු ලැබුවේ රු.මිලියන 2ක වැනි ඉතා සුළු ප්‍රාග්ධනයකින්වන බැවින් පරිපාලිත සමාගම ආරම්භ කර ව්‍යාපෘති බාධාවකින් තොරව කර ගෙන යාමට මව් ආයතනය ලෙස කාර්යාංශයට මූල්‍ය වශයෙන් සහය දීමට සිදු විය. මව් ආයතනය විසින් පරිපාලිත සමාගමට ප්‍රාග්ධනයක් ලෙස මෙම ශේෂයන් හඳුනා ගැනීමට නියමිතවන අතර ඒ සඳහා පරිපාලිත සමාගමේ කළමනාකාරීත්වය සමග සාකච්ඡා කරගෙන යනු ඇත.	කාර්යාංශය හා පරිපාලිත සමාගම අතර සිදුවන ගනුදෙනු සඳහා පැහැදිලි හා විධිමත් ගිවිසුම් ඇතිකර ගත යුතු අතර අදාළ ලැබිය යුතු ශේෂ හෙළිදරව් කිරීමට හා නිරවුල් කිරීමට පියවරගත යුතුය.

1.8 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 83 වගන්තිය, 2006 අංක 10 දරන දේශීය	2009 දෙසැම්බර් 31 දිනට එකතු කළ අගය මත බදු (VAT) හා උපයන විට ගෙවීම් බදු (PAYE) යනාදී	2025 මැයි 31 වන දින වන විට දඩ මුදල් හැර ශේෂය රු. මිලියන 8.18 ක් වන අතර එම ශේෂය මෙම වසරෙහි	2017 අංක 24 දරන දේශීය ආදායම් පනත හා එකතු කළ අගය මත බදු පනත ප්‍රකාරව නොගෙවූ බදු දේශීය

ආදායම් පනතේ 114 වගන්තිය හා 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 26 (1) වගන්තිය	වශයෙන් එකතුව රු.මිලියන 24.94 ක හිඟ බදු මුදලක් හා ඒ මත අයකරන ලද එකතුව රු. මිලියන 33.89 ක දඩ මුදලක් ලෙස මුළු එකතුව රු.මිලියන 58.83ක් කාර්යාංශය විසින් ගෙවීම් පැහැර හරින ලද බදු ලෙස පවතින බව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2024 සැප්තැම්බර් 18 දින තහවුරු කර තිබුණි. කෙසේ වෙතත් 2025 මැයි 31 දිනට විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව ඉහත බදු මුදලින් හිඟ බදු හා දඩ මුදල් එකතුව රු.මිලියන 42.07ක ශේෂයක් තවදුරටත් ගෙවිය යුතුව පැවතුණි.	සැප්තැම්බර් මාසය අගවන විට ගෙවා නිම වනු ඇත. මීට අදාළ දඩ මුදල ගෙවීම කපා හැරීමට උපදේශන කමිටුවට ඉල්ලුම් කර ලිපියක් දැනටමත් යොමු කර ඇත.	ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග නොපමාව ගත යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 607.50 ක බදු පෙර ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ බදු පෙර ලාභය රු.මිලියන 747.54 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 140.04 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට රු. මිලියන 40.99 ක ණයගැති ශේෂයක් සඳහා හානිකරණ අලාභ වෙන්කිරීම, රු. මිලියන 14.85 ක පැරණි ණයගැති ශේෂයන්හි ගිණුම්කරණ වැරදි නිවැරදි කිරීම, වර්ෂයේ බෙදාහැරීමේ වියදම් රු.මිලියන 56.00කින් ඉහළයාම හා බැංකු පොලී අනුපාත අඩුවීමෙන් මූල්‍ය ආදායම් රු.මිලියන 453.00කින් පහළයාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් සහ වියදම් අයිතමයන් පෙර වර්ෂය හා සසඳන විට වැඩිවීමේ හෝ අඩුවීමේ තත්ත්වය පිළිබඳ විශ්ලේෂණයක් පහත දැක්වේ.

විස්තරය	ප්‍රවර්තන වර්ෂයේ වටිනාකම	ඉකුත් වර්ෂයේ වටිනාකම	වෙනස වැඩිවීම / (අඩුවීම)	වෙනසේ ප්‍රතිශතය සියයට
	රු.මිලියන	රු.මිලියන	රු.මිලියන	
ආදායම				
ඉදිකිරීම්	7,157	4,009	3,148	79
උපදේශන	1,777	1,494	283	19
වෙනත් ආදායම්				
විවිධ ආදායම්	57.95	57.19	0.76	1
කුලී ආදායම්	61.22	55.04	6.18	11
මූල්‍ය ආදායම්	443.19	896.77	(453.58)	51
වියදම්				
පරිපාලන වියදම්	562.15	577.79	(15.64)	3
විකුණුම් හා බෙදාහැරීම් වියදම්	56.57	0.60	55.97	9,328
මූල්‍ය වියදම්	3.91	3.65	0.26	7

(අ) කාර්යාංශයේ මූල්‍ය වත්කම් සහ ස්ථාවර වත්කම් පිළිවෙලින් රු.මිලියන 4,414.55 ක් සහ රු.මිලියන 4,211.40 ක් උපයෝගීකර ගනිමින් කාර්යාංශයේ ආදායම ඉහළ නැංවීමට කළමනාකාරීත්වයේ අවධානය යොමු විය යුතුය.

2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේදී දළ ලාභ අනුපාතය සියයට 7ක් වූ අතර පසුගිය වර්ෂයේ දී එය සියයට 4ක් වී තිබුණි. නමුත් මෙහෙයුම් ලාභ ප්‍රතිශතය පෙර වර්ෂයේ දී සියයට 3ක් වී තිබුණ ද සමාලෝචිත වර්ෂයේ දී සියයට 2ක් දක්වා අඩුවී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කාර්යාංශයට අයත් පරිපාලිත සමාගමේ අනුරාධපුර මෙහෙයුම් කාර්යාලයේ 2016 ජනවාරි 01 සිට 2020 ජූනි 22 දක්වා සිදුව ඇතැයි සැළකෙන විෂමාචාරයන් හේතුවෙන් පරිපාලිතයේ විධායක නිලධාරියෙකු 2021 ජනවාරි 11 දින සිට වැඩ තහනමකට ලක් කර තිබුණු අතර කාර්යාංශයේ සභාපතිවරයා විසින් 2021 මැයි 24 දිනැති ලිපියෙන් අදාළ නිලධාරියා වැඩ තහනමට ලක් කළ දිනය වූ 2021 ජනවාරි 11 දින සිට	මෙම නිළධාරියා කාර්යාංශයේ අතිරේක සාමාන්‍යාධිකාරීවරයකු ලෙස කටයුතු කර මධ්‍යම ඉංජිනේරු සේවා (පුද්.) සමාගමේ අනුරාධපුර මූලික කාර්යාලයේ ප්‍රධන මෙහෙයුම් ඉංජිනේරු වශයෙන් සේවය කර තිබුණු කාලසීමාව තුළදී සිදු වූ විෂමචාරයක්වන බැවින් මේ පිළිබඳ මධ්‍යම ඉංජිනේරු	කාර්යාංශය හා පරිපාලිත සමාගම ඒකාබද්ධව විමර්ශණ කටයුතු කඩිනමින් අවසන් කිරීමෙන් පසුව සුදුසු පරිදි විනය/ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.

	බලපැවැත්වෙන පරිදි කාර්යාංශයේ සේවකයකු ලෙස නැවත සේවයේ පිහිටුවා තිබුණි. ඒ සම්බන්ධයෙන් කාර්යාංශය හෝ පරිපාලිත සමාගම කිසිදු විමර්ශනයක් සිදු නොකිරීම, තවදුරටත් මූල්‍ය අක්‍රමිකතා හා අවභාවිතාවන් සඳහා හේතුවන බව විගණනයේදී නිරීක්ෂණය විය.	සේවා ආයතනයෙන් වැඩි දුරටත් විස්තර දන්වන ලෙස මධ්‍යම ඉංජිනේරු සේවා ආයතනය වෙත දැනුම් දී ඇත.	
(ආ)	කාර්යාංශයේ ඉංජිනේරු ප්‍රසම්පාදන ඉදිකිරීම් අංශයට (EPC) අයත් මූලික කාර්යාල 12 ක් විසින් පරිපාලිත සමාගමේ මූලික කාර්යාල වෙත අවස්ථා 15 කදී තාවකාලික ණය (Temporary loans) ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන්වන විට පැවති රු.මිලියන 766.34ක මුළු ණය මුදල තුළ එකතුව රු.මිලියන 526.80ක් වසර 2 සිට 4 දක්වා ද එකතුව රු.මිලියන 260.14ක් වසර 5 ක් ඉක්මවා ද අයවිය යුතුව පැවතුණි. මෙම ණය මුදල් සම්බන්ධයෙන් පොලී මුදලක් අයකර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණු අතර ණය ආපසු අයකර ගැනීමේ සැලැස්මක්ද සකස් කර නොතිබුණි.	මෙම ණය මුදල ලබා දීමේ ප්‍රධාන අරමුණ වූයේ කඩිනමින් වැඩ අවසන් කර භාර දීමට අවශ්‍ය ව්‍යාපෘතීන් හඳුනාගෙන, ඒවා අදාළ සේවා ආයතන වෙත භාරදීම වේ. එමෙන්ම, මෙම මූලික කාර්යාලය භාරගන්නා අවස්ථාවේදී මෙය පාඩු ලබමින් තිබූ අතර බාහිර පාර්ශවයන්ට ගෙවීම් ද රු.මි. 700ට වැඩි මුදලක් පැවතුනි. එසේ පාඩු ලබමින් තිබූ මූලික කාර්යාලය නැවත ලාභ ලබන තත්ත්වයට පත් වීමට හා බාහිර පාර්ශවයන්ට ණය පියවීමට සැළකිය යුතු කාලයක් ගතවන බැවින් මෙම ණය මුදල පියවා ගැනීමට නිශ්චිත සැලැස්මක් ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත.	ණය මුදල් කාලානුරූපීව අයකර ගැනීමට සුදුසු ගිවිසුම්ගත ක්‍රමවේදයක් සැලසුම් කිරීමට කටයුතු කළ යුතුය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මූල්‍ය ප්‍රකාශන අනුව 2023 සහ 2024 වර්ෂවල ඉංජිනේරු ප්‍රසම්පාදන ඉදිකිරීම් (EPC) අංශයේ මෙහෙයුම් ලාභය පිළිවෙලින් රු.මිලියන 74.73ක් සහ රු.මිලියන 86.49ක් වුවද, එහි ඇති අංශ 13න් 7ක සමාලෝචිත වර්ෂය සඳහා එකතුව රු.මිලියන 34.34ක මෙහෙයුම් අලාභයක් ලබා තිබුණි.	ඉදිකිරීම් අංශ කිහිපයක් අලාභ ලැබීමට හේතු වී ඇත්තේ පරිපාලන පිරිවැය එනම් මෝටර් රථ සහ අනෙකුත් වත්කම්වල ක්ෂය වීම, ශුද්ධ ලාභයට වඩා වැඩි අගයක් ගැනීමයි. ඉදිකිරීම් අංශයේ උපරිම ශුද්ධ ලාභය වනුයේ සියයට 2.5 ක් වැනි කුඩා අගයකි. මෙයට හේතුව නම් ව්‍යාපෘති පරිපාලිත සමාගමට අනුයුක්ත කිරීමයි. එසේ වුවත් ඉදිකිරීම් අංශය සතු වත්කම් සම්පූර්ණයෙන්ම පරිපාලිත	ඉංජිනේරු ප්‍රසම්පාදන ඉදිකිරීම් (EPC) අංශයේ දිගින් දිගටම අලාභ ලබන අංශයන් පිරිවැය කළමනාකරණය මඟින් ලාභ ලබන තත්ත්වයට පත්කර ගැනීමට කටයුතු කළ යුතුය.

		සමාගමට පවරා නොදීම මත මෙම පිරිවැය කාර්යාංශයට දැරීමට සිදු වී ඇත.	
(ආ)	ඉදිරිපත් කරන ලද උපදේශන අංශයේ මූල්‍ය ප්‍රකාශනයට අනුව සමාලෝචිත වර්ෂය සඳහා රු. මිලියන 72.50ක මෙහෙයුම් ලාභයක් වාර්තා කර තිබුණ ද, එහි ඇති අංශ 20න් 8ක එකතුව රු.මිලියන 130.47ක මෙහෙයුම් අලාභයක් තිබුණි.	උපදේශන අංශය සේවාව අනුව වර්ගීකරණය කර ඇත්තේ වෙන් කර හඳුනා ගැනීමේ පහසුව සඳහාවන අතර සේවා සපයන අංශ අලාභ ලැබුවත් ව්‍යාපෘති කළමනාකරණය කරන අංශ ලාභ ලබන බැවින් සමස්ත ලාභයක් ලෙස ගණනය කළ යුතුය. කෙසේ වෙතත් අලාභ ලබන අංශ ප්‍රතිව්‍යුහගත කර ඉදිරියේදී ලාභ ලබන තත්ත්වයට පත් කිරීමට කටයුතු කරනු ඇත.	ප්‍රතිව්‍යුහගතකරණය න් විධිමත් පරිදි සිදුකර උපදේශන අංශයේ අලාභ ලබන වියදම් මධ්‍යස්ථාන ලාභ ලබන තත්ත්වයට පත්කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	සෞඛ්‍ය අමාත්‍යාංශය සඳහා නව ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීමට අදාළව 2014 ඔක්තෝබර් 25 දිනැති අංක අමප/14/1447/509/066 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත මහල් 10 කින් හා වර්ග අඩි 230,000 කින් යුක්ත වූ රු.මිලියන 3,896.55ක (බදු සහිත) මුදලකට සැලසුම් නිර්මාණය කර ඉදිකර භාරදීමේ පදනම මත (Design & Build) කාර්යාංශය වෙත 2014 ඔක්තෝබර් 27 දිනැති ලිපියෙන් කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණි. කාර්යාංශය උපදේශනය ද, ඉදිකිරීම් කටයුතු මධ්‍යම ඉංජිනේරු සේවා (පුද්) සමාගම වෙතද භාර දෙන ලදී. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.		
(i)	සැලැස්මට අනුව මාස 24 ක් ඇතුළත වැඩ නිම කළ යුතුව පැවතුණ ද එම කාලය තුළ වැඩ නිම කර නොතිබුණ අතර දෙපාර්ශවය අතර ගිවිසුමකට ද එළඹ නොතිබුණි.	2017 වසරේ දෙවනවරට ලබාදුන් කැබිනට් මණ්ඩල තීරණය අනුව 2018 ජුනි 22 දින සෞඛ්‍ය අමාත්‍යාංශය හා කාර්යාංශය අතර ගිවිසුමකට එළඹෙන ලදී. 2014 වසරේ කැබිනට් මණ්ඩල තීරණය අනුව මෙම ව්‍යාපෘතිය සඳහා අත්තිකාරම් මුදල් ලබාදීම 2016 අගභාගයේ සිට ආරම්භ කරන ලද අතර දෙවන කැබිනට් මණ්ඩල තීරණය	ප්‍රමාදයන් හේතුවෙන් අධික පිරිවැයක් දැරීමට සිදුව ඇති බැවින් නිවැරදි ඇස්තමේන්තු සහ ගිවිසුම් ප්‍රකාරව කඩිනමින් ඉදිකිරීම් නිමකර අලාභ තත්ත්වයන් වළක්වා ගැනීමට කටයුතු කළ යුතුය.

		ලැබුණු පසු ඉතිරි මුදල 2017 වර්ෂය අවසානවන තෙක් අවස්ථා කිහිපයකදී ලබාදීමෙන් සිදුවූ අවිධිමත්භාවය හේතුවෙන් ව්‍යාපෘතියේ වැඩ කටයුතු කර ගෙන යාම ප්‍රමාද වීමට මහත් සේ බලපා ඇත.	
(ii)	2018 ජනවාරි 30 දින දෙවන වරටත් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණු අතර මේ සඳහා 2018 ජූනි 22 දින එළඹි ගිවිසුම අනුව මාස 36 ක් තුළ ව්‍යාපෘතිය නිම කළ යුතුව පැවතුණි. සමාලෝචිත වර්ෂය අවසානවන විට ඉදිකිරීම් කටයුතු ආරම්භ කර වසර 10කට වැඩි කාලයක් ඉක්ම වී තිබුණ ද මේ දක්වා ගොඩනැගිල්ලේ මහල් 16කින් යුතු කොන්ක්‍රීට් ව්‍යුහය නිම කර තිබුණු අතර සමස්ත ව්‍යාපෘතියේම භෞතික ප්‍රගතිය නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි. ඉදිකිරීම් කටයුතු නිම කිරීම සඳහා එක් එක් අවස්ථාවලදී කාලය දීර්ඝ කිරීම් සඳහා කරනු ලැබුණු ඉල්ලීම් අනුව 2023 දෙසැම්බර් 15 දින දක්වා පමණක් කාලය දීර්ඝ කිරීම් අනුමත කර තිබුණි. ඊට පසුව කාලය දීර්ඝ කිරීමට අදාළ අනුමැතීන් ඉල්ලා තිබුණ ද ඊට අදාළ අනුමැතීන් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙතින් ලැබී නොතිබුණි.	මේවන විට ඉදිකිරීමට අදාළ භෞතික කොටස ව්‍යුහය (Structure) හා පෙදරේරු වැඩ (Masonry Works) සිදු කොට ඇති අතර පද්ධති ස්ථාපනය (System Installation) ආරම්භ කිරීමට පියවර ගෙන ඇත. කාර්යාල කොටස් කිරීමේ (Partition Arrangement) සැලසුම් සඳහාවන අනුමැතිය ලැබීම 2021 අගෝස්තු දක්වා ප්‍රමාද වීමත්, මූලික සැලසුම් අනුමත කර ගැනීමේ ප්‍රමාදයත් අත්තිකාරම් මුදල් ලැබීමේදී සිදු වූ ප්‍රමාදයනුත්, මෙම ඉදිකිරීම සිදුකිරීම ප්‍රමාද වීමට පාදක වූ කරුණු වේ. මෙම ව්‍යාපෘතිය ඉදිකිරීමේ කාලය දීර්ඝ කිරීමට ආදාළ ලිපි අමාත්‍යාංශයට ලබා දී ඇති අතර එම ලිපිවලට අනුමැතිය ලබා ගැනීමට කැබිනට් මණ්ඩලයට යොමු කර ඇත. Covid 19 වසංගත තත්ත්වය හා ආර්ථික අර්බුදය හේතුවෙන් 2022 අගෝස්තුවන විට ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු නවතා තිබුණි. එම නිසා එම ඇස්තමේන්තුවට අදාළව වැඩ කටයුතු සිදු කර නොමැත.	ගිවිසුමට අනුව සැලසුම් කඩිනමින් සකස් කර අනුමත කර ගැනීමට හා නියමිත කාල සීමාව තුළ ඉදිකිරීම් අවසන් කර මිල ඉහළයාමේ අවධානම අවම කර ගත යුතුය.
(iii)	2024 ජූලි මස අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා සකස් කර තිබුණු අමාත්‍ය මණ්ඩල සංදේශය පරිදි, 2017 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය සඳහා අනුමත මුළු පිරිවැය රු.මිලියන 5,979.29ක් (බදු සහිත) වූ අතර ව්‍යාපෘතියේ නිමකර ඇති වැඩවල මූල්‍යමය වටිනාකම රු.මිලියන	මෙම ගොඩනැගිල්ලේ සියලු ඉදිකිරීම් 2026 වර්ෂය අවසන්වන විට නිම කිරීමට යෝජිතව ඇති නිසා මේවන විට මුළු ඇස්තමේන්තුවට අදාළ කැබිනට් අනුමැතිය ලබා ගැනීම සඳහා එම ඇස්තමේන්තුව අමාත්‍යාංශය	සාධාරණ හා තාත්වික මිල ගණන් ඇතුළත් ඇස්තමේන්තු පිළියෙල කර ගැනීමට හා ප්‍රතිපාදන වෙන් කළ විගස අප්‍රමාදව ඉදිකිරීම්

	2,752.65ක් (බදු සහිත) පමණ බවත් එම වැඩ විෂයන්ට අදාළ බිල්පත් කොන්ත්‍රාත් සමාගම විසින් ලබා දී ඇති අතර එම ආයතනය වෙත මේවන විට ගෙවීම් කර ඇති මුළු මුදල (20%ක අත්තිකාරම් මුදලද ඇතුලුව) රු. මිලියන 2,669.82 ක්ව (බදු රහිත) පැවතුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතියේ ඉතිරි වැඩ විෂයයන්වලට අදාළ භාණ්ඩ මිල ගණන්වල පවතින ඉහළ මිල විචලනය හමුවේ 2016 වසරේ ඒකක මිල ගණන්වලට සිදුකළ නොහැකි බවත් මෙම ව්‍යාපෘතියේ ඉතිරි වැඩ (Balance Work) විෂයයන් සඳහා දැනට පවතින මිල ගණන් භාවිතා කර සකස් කරන ලද දළ ඇස්තමේන්තු මුදල රු.මිලියන 14,722.54 (බදු සහිත) බවත් ඒ අනුව මෙම ව්‍යාපෘතිය නිම කිරීමට රු.මිලියන 11,835.4ක (බදු සහිතව) අමතර පිරිවැයක් දැරීමට සිදුවන බැවින් අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර ගැනීම සඳහා ඉල්ලීම් කර තිබුණු අතර ඒ අනුව මේ දක්වා ඉදිකිරීම් නිමකිරීමට කටයුතුකර නොතිබුණි.	වෙත යොමු කර ඇත. ඒ සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශ නිලධාරීන් මේවන විට කටයුතු කරමින් පවතී.	නිමකරවා ගැනීමට කාර්යාංශය විසින් සමාගම වෙත උපදේශනයන් සැපයිය යුතුය.
(iv)	2024 ඔක්තෝබර් 03 දිනැති ලිපිය මඟින් කාර්යාංශය විසින් අතිරේක ලේකම් වෙත "පියවර-2" වශයෙන් නැවත සංශෝධිත ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණු අතර එමඟින් 4වන මහල දක්වා නිම කළ යුතු වැඩ/ කාර්යයන්වලට අදාළව රු.මිලියන 7,965.27 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණි. 2024 දෙසැම්බර් 18 දින විගණනය විසින් සිදුකළ භෞතික පරීක්ෂාවේදී 4 වන මහල දක්වා නිම කිරීම, ඇස්තමේන්තුවේ දක්වා ඇති පරිදි සිදුකරන බව නිරීක්ෂණය වුවද එම ඇස්තමේන්තුව සඳහා 2024 වර්ෂය අවසානවන විටත් අනුමැතිය ලැබී නොතිබුණි. 2024 වර්ෂය අවසානවන විට බිල්පත් 47 ක් ඉදිරිපත් කර තිබුණු අතර ඒ අනුව ව්‍යාපෘතියේ නිමකර ඇති වැඩවල මූල්‍යමය වටිනාකම රු.මිලියන 2,818.06ක් වූ අතර මුළු වටිනාකම රු.මිලියන 2,836.71 ක්ව පැවතුණි. මීට අමතරව සියයට 4 ක සැලසුම් හා ව්‍යාපෘති කළමනාකරණ ගාස්තු (Design	2025 වසරේ මාර්තු අවසන් වන විට බිල්පත් 49ක් ඉදිරිපත් කර තිබුණු අතර ඒ අනුව, ව්‍යාපෘතියේ නිමකර ඇති වැඩවල මුළු වටිනාකම රු.මිලියන 3,619.34කි. (සියයට 4ක සැලසුම් කිරීමේ සහ ව්‍යාපෘති කළමනාකරණ ගාස්තු හා මිල විචලනයන් සමඟ) කැබිනට් මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කළ ඉදිකිරීම් ඇස්තමේන්තුව සඳහා කැබිනට් මණ්ඩල අනුමැතිය ලැබුණු පසු මෙම ගෙවීම් අවිනිශ්චිත නොවේ. ඉහත ප්‍රකාශ කළ ආකාරයට ඔවුන් මේ සඳහා කටයුතු කරමින් පවතී. දැනට ඉදිරිපත් වී ඇති කැබිනට් අනුමැතීන් අනුව අප හට රු.මිලියන 5,979.29ක (බදු සහිත) වටිනාකමක් දක්වා ක්‍රියාත්මක කිරීමට හැකිවනු ඇත.	ගොඩනැගිල්ල සම්පූර්ණ නිම කිරීම සඳහා අවශ්‍ය අනුමැතීන් ලද පසු නිවැරදි ඇස්තමේන්තු මත ඉදිකිරීම් කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය.

	& Project Management fee) හා රු.මිලියන 466.49ක මිල විචලනයන් (Price Escalation) සමඟ රු.මිලියන 3,416.67 කි. දෙවන කැබිනට් මණ්ඩල අනුමැතිය ලද ව්‍යාපෘති මුදල ඇතුළත (රු.මිලියන 5,979.9) පවතින බැවින් මෙම බිල්පත් සඳහා මේවන විට රු.මිලියන 2,041.32ක මුදලක් ගෙවා තිබුණ ද මෙම වැඩි කළ රේටයන් සඳහා හා මිල විචලනයන් සඳහා කැබිනට් මණ්ඩල අනුමැතිය මේ දක්වා ලැබී නොමැති බැවින් ඉදිරි ගෙවීම් සඳහා අවිනිශ්චිතතාවයක් පැවතුණි.		
(v)	ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු භාර දී වර්ෂ 10 කට අධික කාලයක් ගත වී තිබුණ ද නිම කිරීමට නොහැකි වීම තුළින් මේ සඳහා සකස් කරන ලද මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.මිලියන 3,896.55 සිට රු.මිලියන 14,722.54 දක්වා එනම් රු.මිලියන 10,825.99 කින් හෙවත් 278% කින් වැඩි වී තිබුණි. නමුත් මේ දක්වා අනුමත ව්‍යාපෘති වටිනාකම රු.මිලියන 5,979.29 ක් පමණි. 2017 මැයි 26 දින ඉදිරිපත් කර තිබුණු අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව සෞඛ්‍ය අමාත්‍යාංශයේ අංශ කිහිපයක් බදු කුලී පදනම මත එක් එක් පෞද්ගලික ස්ථානවල ස්ථානගත වී සිටින බැවින් එම අංශ ද මෙම ඉදිකරමින් පවතින ප්‍රධාන ගොඩනැගිල්ල වෙත ගෙන ඒමේ අරමුණ පෙරදැරි කොටගෙන මහල් 10, මහල් 16 දක්වා වැඩි කිරීමට යෝජනා කර තිබුණි. එසේ වුවද, වර්තමානයේදී මහල් 16න් මහල් 04ක් පමණක් සම්පූර්ණ කරමින් පවතින බැවින් ඉහත අමාත්‍ය මණ්ඩල සංදේශයෙන් බලාපොරොත්තු වූ බදු කුලී මුදල් ගෙවීම අවම කර ගැනීමට මෙමඟින් හැකියාවක් නොලැබෙනු ඇති බවද නිරීක්ෂණය විය.	මෙම ව්‍යාපෘතිය 2026 වසරේ අවසන් කිරීමට දැනට කටයුතු කරගෙන යන අතර ඒ සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශ නිලධාරින් ඉතා යුහුසුලුව වැඩ කටයුතු කරගෙන යයි. ගෙවීම් සහ අනෙකුත් අවශ්‍යතා නියම ආකාරයෙන් සිදුවුවහොත් මෙම ව්‍යාපෘතිය 2026 දී අවසන් වන අතර කුලී පදනමෙන් පවත්නා කාර්යාල මෙම සංකීර්ණයට 2026 අවසානයේ ගෙන යාමට හැකි වනු ඇත.	සම්බන්ධිත පාර්ශව සමඟ සාකච්ඡා මඟින් කඩිනමින් ව්‍යාපෘතිය නිමකර ගොඩනැගිල්ල භාවිතය සඳහා අවස්ථාව ලබා දීමට කටයුතු කළ යුතුය.

(vi)	මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන පරිපාලිත සමාගම විසින්, 2018 ජූනි 20 දින රු.මිලියන 6.93ක් වැයකර Bar Couplers 11,500 ක් මිලදී ගෙන තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍යවන Bar Couplers ප්‍රමාණය නිවැරදිව ගණනය කර නොතිබීම හේතුවෙන් අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩියෙන් මිල දී ගැනීම නිසා වටිනාකම රු.මිලියන 4.63 ක් වූ Bar Couplers 7,628 ක ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි. මෙම ද්‍රව්‍ය විකිණීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. මෙසේ අවශ්‍ය ප්‍රමාණයට වඩා මිලදී ගැනීම, ආයතනයේ කාරක ප්‍රාග්ධනය/ ද්‍රවශීලතාවය කෙරෙහි අහිතකර බලපෑමක්ව පැවතුණි.	නමුත් ඉදිකිරීම් කටයුතු අතරතුර දී ගොඩනැගිල්ලේ සිදු වූ මූලික සැලසුමෙහි (Structural Design) වෙනස්කමක් හේතුවෙන් යෙදීමට තිබුණු කම්බි ප්‍රමාණයන්හි අඩු වීමක් සිදුවිය. මෙම හේතුව උක්ත සඳහන් Bar Couplers ප්‍රමාණයෙහි අතිරික්තයක් ඇති වීමට හේතු වී ඇත.	ඉදිකිරීම් ව්‍යාපෘතියට අදාළ ප්‍රධාන ගිවිසුම්කාර පාර්ශවය උපදේශක කාර්යාංශයවන බැවින් පරිපාලිත සමාගමේ කටයුතු පිළිබඳ නිරන්තරයෙන් අධීක්ෂණය කළ යුතුය.
(vii)	මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මිලියන 69.39 මුදලකට මිලදීගෙන තිබූ Sheet Pile 500ක ප්‍රමාණය දින 1000ක් පමණ භාවිතයෙන් පසු ව්‍යාපෘති භූමියේ ගොඩගසා තිබුණි. මෙසේ දිගුකාලයක් භාවිතයෙන් තොරව ව්‍යාපෘති භූමියේ නිශ්ක්‍රියව පැවතීම නිසා මළබැඳී තිබුණු අතර ඒවා මළබැඳීමට පෙර විකුණා දැමීමට කටයුතු කර නොතිබුණි.	මෙම තත්ත්වය 2023 වර්ෂයේ හඳුනාගත් අතර මෙම අමුද්‍රව්‍ය නැවත විකිණීමට 2023.08.23 දින අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා මඟින් අනුමැතිය ලබා ගන්නා ලදී. ඒ අනුව ඉහත කී Sheet Pile තොගය ටෙන්ඩර් කැඳවා නැවත විකිණීමට උත්සාහ කළ ද ඒ සඳහා ඒ අවස්ථාවේ ආයතනයේ නිසි ක්‍රමවේදයක් නොමැති විය. මෙම Sheet Pile තොගය විකිණීම සඳහා පවතී.	ඉදිකිරීම් ව්‍යාපෘතියට අදාළ ප්‍රධාන ගිවිසුම්කාර පාර්ශවය උපදේශක කාර්යාංශයවන බැවින් පරිපාලිත සමාගමේ කටයුතු පිළිබඳ නිරන්තරයෙන් අධීක්ෂණය කළයුතුය.

3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කාර්යාංශය සතු RV-1537, 46-2726, RV-1493 සහ RV-1346 යන අංක දරන ට්‍රැක්ටර් ට්‍රේලර් රථ 4ක් කාර්යාංශය සතු වාහන යටතේ දක්වා තිබුණ ද ඒවා විගණනයේ දී භෞතිකව දක්නට නොතිබුණි. ඒ සම්බන්ධයෙන් නිසි පරීක්ෂණ සිදුකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.	ට්‍රැක්ටර් ට්‍රේලර් රථ සම්බන්ධයෙන් දැනට පරීක්ෂණයක් පැවැත්වීම සඳහා ඉතා ඉපැරණි ලිපිගොනු පරීක්ෂා කරමින් පවතී. අදාළ රථ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා අදාළ වාර්තාව විගණකාධිපති වෙත භාරදීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත.	විමර්ශන කඩිනමින් අවසන් කිරීමෙන් පසුව අදාළ වාර්තාව විගණනය සඳහා ලබා දීමට හා විධිමත් පරිදි මූල්‍ය ප්‍රකාශනවල ගැලපුම් කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂය තුළ කාර්යාංශයේ සේවයේ නියුතු වෘත්තිකයින් 186	මෙම ගෙවීම් සිදු කරනු ලබන්නේ අධ්‍යක්ෂක මණ්ඩල	රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයන්ට

	දෙනෙකු සඳහා තම පෞද්ගලික වාහන භාවිතා කර කාර්යාලයේ සිට තම පෞද්ගලික නවාතැන වෙත යෑම සහ ඒම වෙනුවෙන් භාණ්ඩාගාර අනුමැතිය රහිතව එකතුව රු.මිලියන 29.9ක මුදලක් ප්‍රවාහන දීමනා ලෙස ගෙවා තිබුණි.	අනුමැතිය යටතේ ආයතනික චක්‍රලේඛයකට අනුව වනු ඇත.	අනුකූලව කටයුතු කළ යුතු අතර අවශ්‍ය සංශෝධනයන් සඳහා භාණ්ඩාගාර අනුමැතිය නොපමාව ලබාගත යුතුය.

3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව කාර්යාංශය සතු වාහන 43 ක් භාවිතයට ගත නොහැකිව විවිධ ස්ථානවල ගාල් කර ඇති අතර ඒවා අලුත්වැඩියා කර භාවිතයට ගැනීම හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම කාර්යාංශය සතු PE-7599 අංක දරන ක්‍රෲ කැබ් (Crew Cab) රථය පරිපාලිත සමාගමේ පොළොන්නරුව ශාඛාව (MKDP) වෙත 2021 ජුනි 04 දින ලබා දී තිබුණු අතර මේවන විට වසරකට වැඩි කාලයක් භාවිතයට ගත නොහැකිව ගාල්කර තිබුණි. කෙසේ වෙතත් මෙහි වර්තමාන තත්ත්වය පරිපාලිත සමාගම විසින් කාර්යංශය වෙත වාර්තා කර නොතිබුණු අතර කාර්යාංශය මඟින් තම පරිපාලිත සමාගම වෙත ලබා දුන් වාහන සම්බන්ධයෙන් නිරන්තර පසු විපරම් සිදු නොකිරීම ද මේ තත්ත්වයට හේතු වී තිබුණි.	භාවිතයට ගත නොහැකි වාහන 43 සම්බන්ධව අපහරණය කිරීමට හෝ විකිණීමට අධ්‍යක්ෂක මණ්ඩලය තීරණය කර ඇති අතර ඒ සම්බන්ධව දැනටමත් කමිටුවක් පත් කර ඇති අතර අවශ්‍ය කටයුතු කරමින් සිටින අතර එය මෙම වර්ෂය තුළ නිම කිරීමට බලාපොරොත්තු වේ. PE 7599 වාහනයට අදාළව මේවන විට පරිපාලිත ආයතනය මඟින් අලුත්වැඩියාව සිදු කරමින් පවතින අතර ඉදිරියේදී කාර්යාංශය වෙත භාර දීමට කටයුතු කරනු ඇත.	අලුත්වැඩියාකර භාවිතයට ගත නොහැකි වාහන කාර්යාංශය වෙත මූල්‍යමය අලාභයක් නොවන පරිදි සාධාරණ මිලට අලෙවි කිරීමට කටයුතු කළ යුතු අතර කාර්යාංශය මඟින් තම පරිපාලිත සමාගම වෙත ලබා දුන් වාහන සම්බන්ධයෙන් නිරන්තර පසු විපරම් කිරීම ද සිදුකළ යුතුය.
(ආ)	අමාත්‍යාංශ සහ අනෙකුත් ආයතන තම කාර්යයන් ඉටුකිරීම සඳහා රාජ්‍ය ව්‍යාපාරවල සම්පත් භාවිතා නොකළ යුතු වුවත් කාර්යාංශය විසින් 1990 වර්ෂයේදී රු. මිලියන 3කට මිලදී ගෙන තිබුණු කොළඹ ටී.බී. ජයා මාවතේ (ඩාලි පාරේ) පිහිටි රූඩ් 02 පර්චස් 24.5 ක් වූ ඉතා ඉහළ වෙළඳපළ වටිනාකමක් සහිත ඉඩම මේ දක්වා කිසිඳු ඵලදායි ආර්ථික කටයුත්තක් සඳහා උපයෝජනය නොකර වාරිමාර්ග අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යාලයේ	මෙම කරුණ සම්බන්ධව කෘෂිකර්ම පශු සම්පත් ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයෙහි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලදී දිගටම සාකච්ඡා කෙරුණ අතර එහිදී අප විසින් මෙම ඉහළ වටිනාකමක් සහිත ඉඩම සඳහා කුලියක් හෝ වෙනත් සුදුසු ඉඩමක් ලබා දෙන ලෙස ඉල්ලීමක් කළ අතර අමාත්‍යාංශය විසින් මෙම	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වාදුන් රජය සතු ව්‍යාපාර සඳහාවන මෙහෙයුම් අත්පොතේ 6.8 ඡේදයට අනුකූලව රාජ්‍ය ව්‍යාපාරවල සම්පත් භාවිතයට කටයුතු කළ යුතුය.

	රථගාල සඳහා කිසිදු අයකිරීමකින් තොරව ලබා දී තිබුණි.	ඉඩමෙහි මහවැලි පරිශ්‍රයෙහි රථ ගාල දිගටම පවත්වාගනිමින් විකල්ප යෝජනා ක්‍රමයක් සකස් කර දෙන ලෙස ඉල්ලීමක් සිදුකර ඇත.	

3.5 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කාර්යාංශයේ මධ්‍යම කළමනාකරණ මට්ටම හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටම් සඳහා අනුමත බඳවා ගැනීමේ පරිපාටියක් සහ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ සැලැස්මක් 2025 මාර්තු 31 දිනවන විටත් සකස් කර අනුමත කරවාගෙන නොතිබුණි.	යෝජිත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය වාරිමාර්ග අමාත්‍යාංශය මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා 2022 ඔක්තෝබර් 31 දින ඉදිරිපත් කර ඇත. එයට පිළිතුරු ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/1712/Voll. II දරන 2023 පෙබරවාරි 15 දිනැති ලිපිය මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ප්‍රසිද්ධ කර ඇති බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය සකස් කර ඉදිරිපත් කරන ලෙස දැනුම් දී තිබුණි. නමුත් ඉංජිනේරුමය කාර්යයන් හා සම්බන්ධ උපදේශක ආයතනයක් වශයෙන් ක්‍රියාත්මක වීමේ දී එසේ ආදර්ශ ආකෘතිය අනුව බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය සකස් කිරීමෙන් ඇතිවිය හැකි ආයතනික ගැටළු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කරන ලදී. තවද මධ්‍යම කළමනාකරණ මට්ටමට අදාළ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා යොමුකිරීමට කටයුතු කරනු ඇත.	කාර්යාංශයේ ජ්‍යෙෂ්ඨ සහ මධ්‍යම කළමනාකරණ මට්ටම්වල තනතුරු සඳහා බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ යෝජනා ක්‍රමයක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය.

(ආ)	වැටුප් රහිත නිවාඩු මත විදේශගතවීම් වෙනුවෙන් කාර්යාංශය සමඟ නිළධාරීන් 13 දෙනෙකු විසින් එකතුව රු.මිලියන 17.09 ක බැඳුම්කර ගිවිසුම් ඇතිකර ගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානවන විට නිළධාරීන් 08 දෙනෙකුගෙන් එකතුව රු.මිලියන 6.56 ක මුදලක් තවදුරටත් අයවිය යුතුව පැවතුණි.	අදාළ විදේශ තානාපති කාර්යාල හරහා මුදල් අයකර ගැනීමට ලිපි ඉදිරිපත් කර ඇත.	බැඳුම්කර ගිවිසුම් කඩකළ නිලධාරීන්ගෙන් හෝ එම ඇපකරුවන්ගෙන් හිඟ මුදල් අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය.